රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 286

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ - 07.
1985 අප්‍රේල් මස 23 වැනි දින

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ණය සහන සභා දෙපාර්තමේන්තු කටයුතු අවසාන කිරීම.

1985 ජූලි මස 1 දින සිට රාජ්‍ය නිලධරයන්ට ණය, අත්තිකාරම් ගිනුම් ක්‍රමයට දෙනු ලැබේ.

ණය සහන සභා ක්‍රමයේ සිට නව ක්‍රමයට වෙනස් කිරීම පහසු කරවීම සඳහා පහත සඳහන් පරිදි ක්‍රියා කරන්න.

(1) දායක මුදල් කපා ගැනීම ( වැටුපෙන් සියයට එකක්) 85.05.01 දිනට පසු නොකළ යුතුය.

(2) 85.04.30 දක්වා කපා ගන්නා ලද සියලුම දායක මුදල් මේ දක්වා කළ පරිදි ණය සහන සභා අධ්‍යක්ෂවරයාගේ බැංකු ගිණුමට බැර කළ යුතුය.

(3) ණය සහන සභාවලින් සාමාජිකයන්ට දෙනු ලබන ණය 85.05.01 සිට 85.06.30 දක්වා අත්හිටුවා ඇත.

(4) ණය සහන සභාවන්ට අයත් බැංකු ශේෂ ගැන කටයුතු කිරීම පිළිබඳ උපදෙස් භාණ්ඩාගාරය නිකුත් කරනු ඇත.

(5) සියලුම ණය සහන සභා ණය වාරිකයන් සහ පොලිය 85.06.30 දින වනතෙක් අයකර ගත යුතුය.

(6) සියලුම ණය සහන සභා කම පොත් සහ ගිණුම් වාර්තා යාවත්කාලීන කළ යුතු අතර, සියලුම පරිශේෂ අවසන් ගිණුම් විගණකාධිපතිවරයාට සහ ණය සහන සභා අධ්‍යක්ෂවරයාට යොමු කළයුතුය.

(7) 85.06.30 දක්වා සේවයෙන් විශ්‍රාම ලබන සාමාජිකයන්ගේ දායක මුදල් ආපසු ගෙවීම මේ දක්වා කළ පරිදි ණය සහන සභා අධ්‍යක්ෂවරයා කරනු ඇත.

(8) 85.07.01 දින හෝ ඉන් පසුව හෝ සේවයේ සිටින නිළධරයන්ගේ දායක මුදල් ආපසු ගෙවීම පිළිබඳ, තවදුරටත් උපදෙස් නිකුත් කරනු ලැබේ.

(9) කෙසේ වෙතත්, ඔබ දැනටමත් 1985 මැයි මය වැටුපෙන් (සියයට එකක) දායක මුදලක් අය කර ගෙන ඇත්තේ නම්, කරුණාකර එකී දායක මුදල් ණය යහන සභා අධ්‍යක්ෂ වෙත නොයවා, ඒ ඒ සාමාජිකයන් හට ආපසු ගෙවන්න.

Siriwardhana

ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

පිටපත: විගණකාධිපති

කු/24.